# බළන්ගොඩ නගර සභා රැස්වීම් වාර්තාව

ස්ථානය : බළන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාව.

දිනය : 2012-06-28

වේලාව : පෙ.ව.09.00

බළන්ගොඩ නගර සභාවේ ගරු සභාපති, ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් සභාවේ කටයුතු පවත්වන ලදී.

**සහභාගීත්වය:-**

| | |
|---|---|
| 01. ගරු සභාපති, | ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ මැතිතුමා |
| 02. ගරු උපසභාපති | ඩබ්.ඒ.වසන්ත පුෂ්පකුමාර ගුණරත්න මැතිතුමා |
| 03. ගරු නාගරික මන්ත්‍රී | ධර්මසේන සමරසිංහ මැතිතුමා |
| 04. ගරු නාගරික මන්ත්‍රී | ඊ.ඒ.ජේ.ප්‍රේමකුමාර මැතිතුමා |
| 05. ගරු නාගරික මන්ත්‍රී | එම්.ටී.එම්. රූමි මැතිතුමා |
| 06. ගරු නාගරික මන්ත්‍රී | එම්. නිමල් කරුණාරත්න මැතිතුමා |
| 07.ගරු නාගරික මන්ත්‍රී | ඒ.අසංක නිල්මිණී විජේසිංහ මැතිතුමා |
| 08. ගරු නාගරික මන්ත්‍රී | චමික ජයමිණ වැවේගෙදර මැතිතුමා |
| 09. ගරු නාගරික මන්ත්‍රී | එම්.ජේ.මලීක්ෂා මැතිතුමා |

**නිලධාරී සහභාගීත්වය:-**

| | |
|---|---|
| 01. එම්.එච්.සීලවතී මිය | ලේකම් |

(01) **ආගම සිහිකිරීම:**

රැස්වීමට පැමිණ සිටි සියළු දෙනා තම තමන්ගේ ආගම සිහිකිරීමෙන් අනතුරුව රැස්වීමේ කටයුතු ආරම්භ කරන ලදි.

(02) **ගරු සභාපතිතුමා විසින් කරනු ලබන නිවේදන :**

ගරු සභාපතිතුමා කථාකරමින් සබරගමුව උතුරු මැද හා නැගෙනහිර පළාත් සභා මේවන විට විසුරුවා ඇති බවත්, ඉදිරියේ දී පළාත් සභා මැතිවරණය පැවැත්වීමට නියමිත බව සඳහන් කරන ලදී. මෙම මැතිවරණයේ දී පළාත් සභා තුනම එක්සත් ජනතා නිදහස් සන්ධානය අතිවිශිෂ්ඨ ලෙස ජයග්‍රහණය කරවීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා බව දැන්වීය. විශේෂයෙන් රත්නපුර දිස්ත්‍රික්කය සඳහා ඉදිරිපත් වන අපේක්ෂකයින්ගේ ජයග්‍රහණය තහවුරු කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා බැව් පවසමින් සභාවේ ඉදිරි වැඩ කටයුතු ආරම්භ කරන ලදී.

## (03) 2012.05.31 වන දින පැවති මහා සභා රැස්වීමේ වාර්තාව සත්‍ය වාර්තාවක් බවට සභා සම්මත කිරීම

2012.05.31 වන දින පැවැති මාසික මහ සභා රැස්වීමේ වාර්තාව සත්‍ය වාර්තාවක් බවට ගරු නාගරික මන්ත්‍රී ධර්මසේන සමරසිංහ මැතිතුමා විසින් යෝජනා කරන ලද අතර, එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී එම්.නිමල් කරුණාරත්න මැතිතුමා විසින් ස්ථිර කිරීමෙන් වාර්තාව සභා සම්මත විය.

## (04) පසුගිය වාර්තාව සමාලෝචනය කිරීම

වාර්තාව සමාලෝචනය කිරීමක් සිදුනොවීය.

## 05. පසුගිය සභාවේ දී ගනු ලැබූ තීරණ ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය ඉදිරිපත් කිරීම :

පසුගිය සභාවේ දී ගනු ලැබූ තීරණ ක්‍රියාත්මක කිරීමේ ප්‍රගති ගරු මන්ත්‍රීතුමන්ලාගේ දැනගැනීම පිණිස සභාවට ඉදිරිපත් කරන ලදී.

## 06. සභාවට ලැබී ඇති ලිපි/පෙත්සම්/පැමිණිලි ආදිය ඉදිරිපත් කිරීම:

### 06:01 හිඟ වරිපනම් බදු නිදහස් කරගැනීම :

බළන්ගොඩ පරණ පාරේ අංකඃ 25 දරණ වෙළඳසැල සඳහා 2005 වර්ෂය වන විට වරිපනම් බදු වර්ෂයකට රු.11538.58 ක් ව තිබුණ බවත් , කාලයක් මෙම කඩය වසා තිබුණ බැවින් සභා තීරණයක් මත රු.3439/- ක මුදලක් අඩුකල අතර, නව තක්සේරුව අනුව රු.20768/- දක්වා වරිපනම් මුදල වැඩිකර ඇති බැවින් එය ගෙවීම අපහසු බව සදහන් කරමින් බළන්ගොඩ වීරසුන්දරාරාම යන ලිපිනයේ පදිංචි බී.එස්.සී.ප්‍රනාන්දු මහතා විසින් ඉදිරිපත් කර ඇති ලිපියක් සභාගත කරන ලදී.

වරිපනම් බදු අඩු කිරීම සඳහා තක්සේරු දෙපාර්තමේන්තුව වෙත දන්වා යැවීමට සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

### 06:02 බළන්ගොඩ කලාප කාර්යාලයේ පිවිසුම් මාර්ගය අළුත්වැඩියා කරගැනීම :

බළන්ගොඩ කලාප අධ්‍යාපන කාර්යාලයට පිවිසෙන මාර්ගය දැනට අවුරුදු කිහිපයක සිට අබලන් තත්ත්වයේ පවතින නිසා එදිනෙදා කාර්යාලයේ සේවය කිරීමට පැමිණෙන නිලධාරීන් හා සේවය සලසා ගැනීමට පැමිණෙන සියළු දෙනාට අපහසුතාවයන්ට මුහුණ පෑමට සිදුව ඇති බැවින්, මෙම පිවිසුම් මාර්ගය අලුත්වැඩියා කරදෙන ලෙස ඉල්ලා, බළන්ගොඩ කලාප අධ්‍යාපන කාර්යාලයේ සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් එවා ඇති ලිපියක් සභාගත කරන ලදී.

පළාත් මාර්ග අමාත්‍යාංශය වෙත දන්වා යැවීමට සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

### 06:03 ඇල්ලෙපොල සරස්වතී පාර සකස් කරගැනීම:

බළන්ගොඩ නගර සභා බලප්‍රදේශයේ ඇල්ලෙපොල සරස්වතී පාර වසර ගණනාවක සිට ප්‍රතිසංස්කරණය නොකිරීම හේතුවෙන් දැනට මාර්ගයේ ගමන් කිරීමේ අපහසුතාවක් උදා වී ඇති බැවින්, මෙම මාර්ගය සකස් කරදෙන ලෙස ඉල්ලා, බළන්ගොඩ, ඇල්ලෙපොල, සරස්වතී පාර, අංකඃ 28 දරණ ලිපිනයේ පදිංචි ජී.ජයරත්න මහතා විසින් ඉදිරිපත් කර ඇති 2012-06-24 දිනැති ලිපිය සභාගත කරන ලදී.

මෙම ඉල්ලීම කර්මාන්ත කමිටුව වෙත යොමුකිරීමට සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

06:04 **කාණු පද්ධතිය සකස් කරගැනීම :**

බළන්ගොඩ , කිවුලෙවලෙ කාණු පද්ධතිය අපවත්‍රවීම නිසා ප්‍රදේශවාසීන්ගේ සෞඛ්‍යයට තර්ජණයක් සිදුව ඇති බැවින් , මෙම කාණු පද්ධතිය සකස් කරදෙන ලෙස ඉල්ලා, කිවුලෙවෙල ගම්වාසීන් විසින් ඉදිරිපත් කර ඇති ලිපියක් සභාගත කරන ලදී.

මෙම ඉල්ලීම කර්මාන්ත කමිටුව වෙත ඉදිරිපත් කිරීමට සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

06:05 **බැංකු සැසඳුම් නිරවුල් කිරීම :**

මෙම සභාව මගින් පවත්වාගෙන යන ලංකා බැංකු ගිණුම/පොදු ගිණුම/කොම්පෝස්ට් ගිණුම/UDA ගිණුම/පරිසර ගිණුම හා තානායම් ගිණුමට අදාල බැංකු සැසඳුමෙහි අඩුපාඩු/දෝෂ ඌණතාවයක් පවතින බැවින්, එම දෝෂයන් නිවැරදි කිරීම සඳහා පහත සඳහන් පුද්ගලයින්ගෙන් සමන්විත කමිටුවක් පත්කර එම කමිටුව විසින් ගනු ලබන නිර්දේශයන්/තීරණ වලට අනුව නිවැරදි කිරීම් සිදුකිරීම සුදුසු බැවින්, ඒ සඳහා අවශ්‍ය අනුමැතිය ලබාදෙන ලෙස ඉල්ලා ඉදිරිපත් කර ඇති ලිපියක් සභාගත කරන ලදී.

සභාපති/ලේකම්/ගණකාධිකාරී/ව්‍යාපෘති සමායෝජක
පළාත් පාලන කොමසාරිස් කාර්යාලයේ නිලධාරී මහතෙකු

ඉහත සදහන් කමිටුව පත්කර අදාල කාර්යයන් සිදුකිරීමට සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

07. **මුදල් ගෙවීම් අනුමත කිරීම ( රු.10000/- ට වැඩි ගෙවීම් )**

රු.10000/- ට වැඩි ගෙවීම් 2012-06-25 වන දින පැවති මුදල් කමිටුවේ දී අනුමත කර ඇති බව සභාවට වාර්තා කර තිබුණි.

08. **ඇස්තමේන්තු ඉදිරිපත් කිරීම**

08:01 පුරණගෙදර මාර්ගයේ පැති බැම්ම ඉදිකිරීම කර්මාන්තය රු.125000/-

ඇස්තමේන්තුව අනුමත කල සභාව, මෙම කර්මාන්තයේ වැඩ කටයුතු සිරිවිජය ග්‍රාම සංවර්ධන සමිතිය වෙත පවරා ඉටුකරගැනීමට සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

09. **ටෙන්ඩර් මිළ ගණන් සලකා බැලීම**

ටෙන්ඩර් මිළ ගණන් 2012-06-25 වන දින පැවති ප්‍රසම්පාදන කමිටුවට ඉදිරිපත් කර තිබුණු අතර, එහි වාර්තාව සභාවට ඉදිරිපත් කරන ලදී.

මෙම කමිටු වාර්තාව සභාව විසින් අනුමත කරන ලදී.

10. **යථා පරිදි කල් දී ඇති ප්‍රශ්ණ** : නැත

11. **යෝජනා**

11:01 **ගරු නාගරික මන්ත්‍රී,ධර්මසේන සමරසිංහ මැතිතුමා :**

01. අඩු ආදායම්ලාභීන් සඳහා දෙන සනීපාරක්ෂක දීමනාව රු.15000/- කිරීම.

අයවැය මගින් අඩුආදායම්ලාභීන්ට සනීපාරක්ෂක දීමනාව ලෙස රු.5000/- ක මුදලක් ලබාදෙන බවත්, මෙය වැසිකිළිවල කපාගැනීමටවත් ප්‍රමාණවත් නොවන බවත්, එම නිසා ඒ කෙරෙහි අවධානය යොමුකර වැසිකිළියක් සාදා ගැනීම සඳහා අවශ්‍ය ද්‍රව්‍ය හෝ සභාව මගින් ලබාදීමට කටයුතු කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

මෙම වර්ෂය සඳහා අයවැය ලේඛනය සකස් කර අවසන් බැවින් , ඊළඟ අයවැය සකස් කිරීමේ දී මේ සම්බන්ධව සලකා බලන බව ගරු සභාපතිතුමා විසින් පැවසීය.

02. කොම්පෝස්ට් ව්‍යාපෘතියේ කම්කරුවන් සඳහා සෞඛ්‍ය රක්ෂණයක් ඇතිකිරීම.

කොම්පෝස්ට් ව්‍යාපෘතිය සඳහා බඳවා ගෙන ඇති සෞඛ්‍ය කම්කරුවන් සඳහා දැනට ද සෞඛ්‍ය සායන ආදිය පවත්වන වන අතර, මෙම සේවකයින් තාවකාලිකව සේවය කරන නිසා මේ සම්බන්ධව ස්ථිර තීරණයකට එළඹ කටයුතු කිරීමට අපහසු බව ගරු සභාපතිතුමා විසින් පැවසීය.

03. දොරවෙල පැරණි පාලම අසල සිට අළුත් පාලම දක්වා ගඟ දෙපස ශුද්ධ කර දැකුම්කළු ලෙස සකස් කිරීම.

ආපදා කළමණාකරණ ව්‍යාපෘතිය යටතේ දොරවෙල ඔය දෙපස සංරක්ෂණය කිරීමට ඉදිරියේ දී කටයුතු කරන බැව් ගරු සභාපතිතුමා විසින් දැන්වීය.

04. වැඩ නිමවීමට ආසන්න නාගරික ළමා උද්‍යානය සඳහා උද්‍යාන පාලකයෙක් සභා අනුමැතියට යටත්ව බඳවා ගැනීම.

මෙම යෝජනාව පළාත් සභාව වෙත යොමුකිරීමට තීරණය විය.

05. වාර්ෂිකව විශ්ව විද්‍යාල සිසුන් සඳහා ලබාදෙන ශිෂ්‍යත්ව අරමුදල රු.7500/- කිරීමට යෝජනා කිරීම.

06. මහපොළ ශිෂ්‍යත්ව අරමුදල ක්‍රියාත්මක කිරීම සඳහා දේශපාලන අධිකාරිය දැනුවත් කිරීම.

මහපොල ශිෂ්‍යත්ව ලබාදීම සඳහා විශාල මුදලක් ලංකා බැංකුවේ තැන්පත් කර ඇති බවත්, මුදල් බැංකුවේ තැන්පත් කිරීමෙන් ඵලක් නොමැති බැවින් මෙම අරමුදල සක්‍රීය කර විශ්ව විද්‍යාල සිසු දරු දැරියන්ගේ අධ්‍යාපන කටයුතු සඳහා ලබාදීමට අදාල බලධාරීන්ගේ අවධානය යොමුකරන ලෙස ඉල්ලා සිටින ලදී.

මෙම යෝජනාව දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීමට ඉදිරිපත් කිරීමට සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

ඉහත සඳහන් යෝජනා ගරු නාගරික මන්ත්‍රී චමික ජයමිණ වැවේගෙදර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

11:02 **ගරු නාගරික මන්ත්‍රී එම්.ජේ.මලීක්ෂා මැතිතුමා :**

01. ගොරොක්ගහමඩ දුණුමඩලගහවත්ත පාරේ අතුරු පාර ( ජාතික පාසල පිටුපස මාර්ගය) ද්‍රවිඩ ජාතික අධ්‍යාපනය සහ වෙනත් පොදු කටයුතු වලදී උදව් කල ආර්.ටී.සුන්දරම් (අභාවප්‍රාප්ත) මහතා නමින් නම් කිරීම.

ඉහත සදහන් නමින් එම මාර්ගය නම් කිරීම සුදුසු දැයි පරීක්ෂා කිරීම සදහා ප්‍රදේශවාසීන්ගේ විරෝධතා සලකා බැලීමට සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

02. කරව්කැටිය උඩකන්ද පාර මිරිස්වත්ත සුහයිර් අලීම් මාවත , බෙතල්හිල් මාවත කඩිනමින් අලුත්වැඩියා කිරීම.

03. ෆලීල් හජ්ජියාර් මාවත පටන් ගන්නා මංසන්ධිය විශාල පිරිසක් එන යන ස්ථානයක් බැවින්, මාර්ග සංවර්ධන අධිකාරිය සමඟ සාකච්ඡාකර පාර මාරුවීමට කහ ඉරි සලකුණු කිරීම.

මෙම ඉල්ලීම මාර්ග සංවර්ධන අධිකාරිය වෙත යොමුකිරීමට සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

04. මන්ත්‍රීවරයෙකුට අලුතෙන් පවරාගත් නගර සභා බලප්‍රදේශය තුළ විදී පහන් 05 බැගින් ලබාදීමට අවශ්‍ය කටයුතු කිරීම.

ඉහත යෝජනා අතුරින් පළමු යෝජනාව ක්‍රියාත්මක කිරීම සුදුසු දැයි විමසීමෙන් පසුව ඉටුකරන ලෙසත්, එම යෝජනාව හැර අනෙකුත් යෝජනා ස්ථිර කරන බැව් ගරු නාගරික මන්ත්‍රී චමික ජයමිණ වැවේගෙදර මැතිතුමා විසින් පැවසීය.

11:03 **ගරු නාගරික මන්ත්‍රී, එම්.නිමල් කරුණාරත්න මැතිතුමා :**

01. ගම ගෙදර පාරේ පොඩි අප්පුහාමි මහතාගේ **නිවස** අසල පැතිබැම්ම ඉදිකිරීම.

මෙම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී එම්.ටී.එම්.රූමි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

11:04 **ගරු නාගරික මන්ත්‍රී, ඒ.අසංක නිල්මිණි විජේසිංහ මැතිතුමා :**

01. නගරයේ තාප්පවල සහ බිත්තිවල පෝස්ටර් ඇලවීම තහනම් කිරීම නිසා නගරයේ අලංකාරයත් , පිරිසිදුකමත් සිදු වී ඇති බැවින්, පෝස්ටර් ඇලවීම සදහා ඉදිකර ඇති දැන්වීම් පුවරු ගණන ප්‍රමාණවත් නොවන බැවින්, සුදුසු ස්ථානවල තවත් දැන්වීම් පුවරු කිහිපයක් ඉදිකිරීම.

මැතිවරණ ප්‍රචාරක කටයුතු සදහා පොලිතීන් යොදා ගැනීම තහනම් කිරීමට පොලිස් ස්ථානය දැනුවත් කිරීමට සභාවේ ඒකමතික අනුමැතිය ලබාදෙන ලදී.

11:05 **ගරු නාගරික මන්ත්‍රී, එම්.ටී.එම්.රූමි මැතිතුමා** :

01. නීත්‍යානුකූලව පවත්වාගෙන යන ගෝඝාතකාගාරය පොලීසිය විසින් වසා දැමීමට නියෝග කර තිබීම සම්බන්ධයෙන් විරෝධය පළකරන බව ගරු නාගරික මන්ත්‍රී එම්.ටී.එම්.රූමි මැතිතුමා විසින් පැවසීය.

**ගරු නාගරික මන්ත්‍රී, චමික ජයමිණ වැවේගෙදර මැතිතුමා :**

ගරු මන්ත්‍රීතුමා කථාකරමින්, ගෝඝාතකාගාරයට අදාළව ගරු නාගරික මන්ත්‍රී, එම්.ටී.එම්.රූමි මැතිතුමා විසින් කරන ලද යෝජනාව සම්බන්ධව අදහස් පළකල යුතු බැව් දැන්වීය.

බළන්ගොඩ , මිරිස්වත්ත පිහිටි ගෝඝාතකාගාරය ගෝඝාතක ආඥා පනත අනුව නීත්‍යානුකූලව පවත්වාගෙන නොයන බැව් පැවසීය. එම පනත අනුව ගෝඝාතකාගාරයක් පවත්වාගෙන යා හැක්කේ අදාල නිර්ණායකයන් සම්පූර්ණ කිරීමෙන් පසුව බවත්, මෙම ස්ථානය එම අදාල කොන්දේසි සපුරා නොමැතිව පවත්වාගෙන යන බැව් පැවසීය. මෙම සභාව මගින් මෙය ප වත්වාගෙන යාමට වෙළඳ බලපත්‍රයක් නිකුත් කර ඇති බවද පැවසීය. පසුගිය දා මෙම ගෝඝාතාකාරය වෙත මී ගවයින් දෙදෙනෙකු ඝාතනය සඳහා ගෙනඒමේ දී බළන්ගොඩ පොලිස් ස්ථානය විසින් අදාල අයවලුන් අත්අඩංගුවට ගෙන නීත්‍යානුකූල ක්‍රියාමාර්ග ගෙන මෙම ගෝඝාතකාගාරය තාවකාලිකව වසා දැමීමට නියෝග කර ඇති බැව් පැවසීය. ගෝඝාතකාගාරයක් තුළ මී ගවයින් ඝාතනයට නීතියෙන් ඉඩක් නොමැති බැව් පැවසූ ගරු මන්ත්‍රීතුමා , පාරිභෝජනයට නුසුදුසු සහ සෞඛ්‍ය සම්පන්න නොවන ආකාරයට මෙය පවත්වාගෙන යාම බරපතල වරදක් යැයි පැවසීය. නීත්‍යානුකූළ නොවන ආකාරයට යම් කටයුත්තක් සිදුවන විට ඒ සම්බන්ධව ක්‍රියාකිරීම පොලිස් ස්ථානයේ වගකීම බවත්, එම ක්‍රියාවනට විරෝධය ප්‍රකාශ කිරීම වගකිව යුතු මහජන නියෝජිතයින් වන අපගේ වගකීම නොවන බැව් අවධාරණය කල අතර, යම් වරදක් සිදුවන විට ඒවා නිවැරදි කිරීමට කටයුතු කිරීම/සහය දැක්වීම මහජන නියෝජිතයින් වන අපගේ යුතුකම හා වගකීම යැයි වැඩිදුරටත් අදහස් දක්වමින් පැවසීය.

මෙම ගෝඝාතාකාගාරය නීත්‍යානුකූල අන්දමින් පවත්වාගෙන යාම සම්බන්ධව සිය විරෝධයක් නොමැති බව තවදුරටත් පැවසිය.

මෙම සභාව මගින් අදාල ව්‍යාපාරය පවත්වාගෙන යාම සඳහා වෙළඳ බලපත්‍රයක් නිකුත් කර ඇති බවත්, එම වෙළඳ බලපත්‍රය නිකුත් කරනු ලැබුවේ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී/ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ නිර්දේශයන්ට යටත්ව බවත් වාර්ෂිකව මස් කඩ බදුදෙමින් සභාවේ ආදායම් උත්පාදනය කිරීම සභාවේ වගකීමක් යැයි ගරු සභාපතිතුමා පැවසීය. මෙම ගෝඝාතකාගාරය නීත්‍යානුකූව පවත්වාගෙන යන බවත්, මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයා දිනපතා මෙම ස්ථානය පරීක්ෂා කරන බවත් පැවසීය. නීත්‍යානුකූල නොවන කාරණාවක් සිදුවන්නේ නම් මෙම සභාව දැනුවත් කර, නීත්‍යානුකූල ක්‍රියාමාර්ග ගැනීම මිස එසේ නොමැතිව ගෝඝාතකාගාරය වසා දැමීමට නියෝග කිරීමට පොලීසියට නොහැකි බැව් ගරු නාගරික මන්ත්‍රී එම්.ටී.එම්.රූමි මැතිතුමා විසින් පැවසීය. මෙම කාරණාවනිසා සභාවට ලැබෙන ආදායම අහිමිවීමෙන් සභාව විගණන විමසුම් වලට ද ලක්වන බැව් ගරු සභාපතිතුමන් විසින් පැවසීය. ගෝඝාතකාගාරය දින 03 ක් අඛණ්ඩව වසා දැමීමට අදාළ ටෙන්ඩර්කරුගෙන් මේ වන විට ලිඛිත කරුණු විමසා ඇති බවද වැඩිදුරටත් පැවසීය. බළන්ගොඩ පොලීසියේ ඇතැම් පොලිස් නිලධාරීන් නිලය අනිසි ලෙස පාවිච්චි කරමින් ජනතාව හිංසාවට පීඩාවට ලක්කිරීමට කටයුතු කරන බැව් ගරු නාගරික මන්ත්‍රී ඊ.ඒ.ජයන්ත ප්‍රේමකුමාර මැතිතුමා හා ගරු උපසභාපති, ඩබ්.ඒ.වසන්ත පුෂ්පකුමාර ගුණරත්න මැතිතුමා විසින් පැවසීය.

මේ සම්බන්ධව සියළු පාර්ශවයන් කැඳවා කරුණු සාකච්ඡා කිරීමට සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

12. **ආදායම් - වියදම් වාර්තා හා අනෙකුත් වාර්තා ඉදිරිපත් කිරීම.**

2012මැයි වර්ෂයේ අප්‍රේල් මාසයට අදාළ ආදායම් හා වියදම් පිළිබඳ වාර්තාව සභාවට ඉදිරිපත් කර තිබුණි.

| | |
|---|---|
| පුනරාවර්ථන ලැබීම් | 4,114,846.25 |
| වෙනත් ලැබීම් | 850,109.72 |
| **මුළු ලැබීම්** | **4,964,955.97** |
| පුනරාවර්ථන වියදම් | 5,100,909.65 |
| වෙනත් වියදම් | 1,121,495.47 |
| **මුළු වියදම්** | **6,222,405.12** |

මෙම ආදායම් හා වියදම් වාර්තාව සභාව විසින් අනුමත කරන ලදී.

- ❖ බළන්ගොඩ නගර සභා තානායමේ 2012-05-01 සිට 2012-05-30 දක්වා වෙළඳ හා ලාභඅලාභ ගිණුම සභාවට ඉදිරිපත් කරන ලදී.

| විස්තරය | 2012.05.01 සිට 2012.05.31 දක්වා |
|---|---|
| විකුණුම් | 1,890,903.94 |
| **විකුණුම් පිරිවැය** | **1,158,993.73** |
| දළ ලාභය | 731,910.21 |
| ශුද්ධ ලාභය/අලාභය | 487,571,78 |

මෙම ලාභඅලාභ ගිණුම සභාව විසින් අනුමත කරන ලදී.

- ❖ 2012.05.01 දින සිට 2012.05.30 දින දක්වා මෙම සභාව සතු වාහන සඳහා වැය වී ඇති ඉන්ධන පිළිබඳ වාර්තා සභාවට ඉදිරිපත් කරන ලදී.
- ❖ මෙම ඉන්ධන වාර්තා සභාව විසින් අනුමත කරන ලදී.

13. **කාරක සභා වාර්තා ඉදිරිපත් කිරීම**

2012.06.15 වන දින පැවති මහජන පුස්තකාල උපදේශක කමිටු රැස්වීමේ වාර්තාව / 2012.06.19 වන දින පැවති සෞඛ්‍ය හා ඝන අපද්‍රව්‍ය කළමණාකරණ කමිටුවේ වාර්තාව 2012.06.25 වන දින පැවති මුදල් ප්‍රතිපත්ති හා ප්‍රසම්පාදන කමිටුවේ වාර්තාව, සභාවට ඉදිරිපත් කරන ලදී.

මෙම වාර්තාවන් සභාව විසින් අනුමත කරන ලදී.

14. **වෙනත් කරුණු :**

**14:01 ගරු නාගරික මන්ත්‍රී, එම්.ටී.එම්.රූමි මැතිතුමා :**

පසුගිය සභාවේ දී තුඹගොඩ ප්‍රදේශයේ සහ කල්තොට ප්‍රදේශයේ කාණු පද්ධතිය සම්බන්ධව කරුණු දැක් වු බවත්, එම කරුණු පුවත්පත්වල පළවීම නිසා ඒ කෙරෙහි මාර්ග සංවර්ධන අධිකාරියේ අවධානය යොමු වී එම නිලධාරීන් පැමිණ තුඹගොඩ ප්‍රදේශයේ කාණු පද්ධතිය ස්ලැබ් කිරීමට මේවන විට අවශ්‍ය පසුබිම නිර්මාණය කල බවත්, ඒ සඳහා සභාවෙන් අවශ්‍ය සහයෝගය ක්ෂණිකව ලබාදීමට ගරු සභාපතිතුමා කටයුතු කල බැවින් ඒ සම්බන්ධව ගරු සභාපතිතුමාට සිය ස්තුතිය පළකරන බව පැවසීය.

මෙවැනි කාරණා කෙරෙහි අදාල ආයතනවල අවධානය යොමුකරවීම සඳහා මාධ්‍යවේදීන් ඉටුකරන ලබන සේවය ප්‍රශංසනීය බවත්, ඒ සම්බන්ධ මාධ්‍යවේදී මහතුන්ට මාර්ග සංවර්ධන අධිකාරියේ අදාල නිලධාරීන්ටත් සිය ප්‍රණාමය පළකරන බැව් පැවසීය.

මේවන විට  සබරගමුව ඇතුළව පළාත් සභා දෙකක් විසුරුවා ඇති බවත්, සබරගමුව ප්‍රධාන අමාත්‍ය මහීපාල හේරත් මැතිතුමා සබරගමුවට පළාතට ඉමහත් සේවයක් කල බවත්, එතුමා ජාති ආගම් කුළභේද පක්ෂභේද නොසලකා සැම දෙනාටම සමාන ඉටුකරන ලද ජනතා මෙහෙවරට කෘතවේදීතාව පළකරන බැව් පැවසීය.

**14:02 ගරු නාගරික මන්ත්‍රී, ඒ.අසංක නිල්මිණි විජේසිංහ මැතිතුමා**

ගරු මන්ත්‍රීතුමා සභාව අමතමින් බළන්ගොඩ නගරයේ අනතුරු අවම කිරීම සඳහා සංඥා පද්ධති ( රේඩියම් සිස්ටම් ) සකස් කිරීම සම්බන්ධව මාර්ග සංවර්ධන අධිකාරියේ නිලධාරීන්ට පළමුව ස්තුතිය පළකරන බව පැවසීය. වැවේවත්ත කාණු පද්ධතිය අවහිරවීම නිසා දමිල ජනතාවට මුහුණ දීමට සිදුව ඇති අපහසුතාව සම්බන්ධව පසුගිය සභාවේ දී කරුණු ඉදිරිපත් කල බවත්, ඒ කෙරෙහි කිසිදු අවධානයක් යොමු නොකිරීම සම්බන්ධව කණගාටුව ප්‍රකාශ කරන බව පැවසීය. වැවේවත්ත ගාර්ඩන් හි මෙම කාණු පද්ධතිය අවහිරවීම නිසා එම ප්‍රදේශයේ ජනතාවගේ සෞඛ්‍යාරක්ෂාවට ප්‍රබල තර්ජණයක් සිදු වී ඇති බව නැවත වරක් අවධාරණය කරන අතර, හැකි ඉක්මණින් මේ සම්බන්ධව නිසි පියවරක් ගන්නා ලෙසි ඉල්ලීමක් කරන ලදී.( වැවේවත්ත වතුයාය තට්ටු නිවාස යෝජනා ක්‍රමක් සඳහා තෝරාගෙන ඇති බැවින් , ඉදිරියේ දී එහි වැඩ කටයුතු ආරම්භ කිරීමට යෝජිත බව ගරු සභාපතිතුමන් විසින් පැවසීය.

14:03 ගරු **උපසභාපති, ඩබ්.ඒ.වසන්ත පුෂ්පකුමාර ගුණරත්න මැතිතුමා :**

ගරු උපසභාපතිතුමා කථාකරමින්, සුදර්ශනපුර මාර්ගය හා දෙණියකුඹුර පාර අබලන් බැවින්, එය සකස් කරදෙන ලෙස ඉල්ලීමක් කරන ලදී. වැවේවත්ත වතුයාය කට්ටිකර විකිණීමේ දී වතු අධිකාරිවරයා කාණු පද්තියක් සම්බන්ධව නොසලකා ඉඩම් විකිණීම සිදුකල බවත්, එම නිසා ස්වභාවික කාණු අවහිර වී එම වතුයායේ ජනතාව මහත් අපහසුතාවකට ලක්ව ඇති බවත්, මෙම කාරණය වර්ෂ ගණනාවක සිට පෙන්වා දෙන බවත්, නමුත් ඒ සම්බන්ධව නිසි විසඳුමක් නොලැබුණු බවත් මෙම කාණු පද්ධතිය සකස් කිරීම ඉතා අත්‍යාවශ්‍ය බැව් අවධාරණය කරන බව පැවසීය.

14:04 **ගරු නාගරික මන්ත්‍රී , ඊ.ඒ.ජයන්ත ප්‍රේමකුමාර මැතිතුමා :**

ගරු මන්ත්‍රීතුමා සභාව අමතමින් මෙම වර්ෂය තුළ කාර්මාන්ත රැසක වැඩ නිමකර ඇති බැව් කර්මාන්ත කමිටුවේ සභාපතිවරයා ලෙස සඳහන් කරන බව පැවසීය.  ගරු උපසභාපතිතුමා ප්‍රකාශ කල මාර්ග දෙක ඉදිරි මාසය තුළ නිමකිරීමට පියවර ගන්නා බවත් , ගැමුණු වෙළඳ සංගමය මගින් පසුගිය සභාවට ඉරිදා පොලේ ව්‍යාපාර සඳහා කඩ ලබාගැනීමට අදාලව ඉදිරිපත් කල ලිපිය කෙරෙහි අවධානය යොමුකර එම වෙළඳුන්ට සාධාරණ ආකාරයට ව්‍යාපාර කරගෙන යාම සඳහා කඩ කාමර ලබාදෙන ලෙස ඉල්ලීමක් කරන ලදී.

ඉරිදා පොළ භූමියට ත්‍රීරෝද රථ ඇතුළු කිරීම හා නවතා තැබීම නිසා මහජනතාවට අපහසුතාවට හා අනතුරු වලට ලක්වීමේ අවධානමක් පවතින බැවින් ත්‍රීරෝද රථ නවතා තැබීමට නිසි ක්‍රමයක් සකස් කරන ලෙස ඉල්ලීමක් කරන ලදී. කාර්පාක් ඉදිරිපිට පිවිසුම් මාර්ගයේ මැදින් සුදු ඉරක් ගසා මාර්ගය වෙන් කිරීමට ක්‍රියාකරන ලෙසත් ,  මහජනතාවට මාර්ගය මාරුවීමට කහහරක් යෙදීමට පියවර ගන්නා ලෙසත් ඉල්ලීමක් කරන ලදී. බැංකු සඳහා වෙන්කර ඇති ඉඩම් හඳුනා ගැනීම සඳහා සලකුණු යෙදීමට ක්‍රියාකරන ලෙසත් ඉල්ලීමක් කරන ලදී.

14:05 **ගරු නාගරික මන්ත්‍රී එම්.ජේ.මලීක්ෂා මැතිතුමා :**

ගරු මන්ත්‍රීතුමා සභාව අමතමින් මේ වනවිට සබරගමුව,උතුරු මැද හා නැගෙනහිර පළාත් සභාවන් විසුරුවා ඇති බවත්, ඉදිරියේ දී පළාත් සභා ඡන්දය පැවැත්වීමට නියමිත බවත් පැවසීය. මෙම මැතිවරණය ඉතා සාමකාමීව නිදහස්ව හා සාධාරණ පැවැත්වීමට සියළු පක්ෂ සමාජිකයින් සහායෝගීව ක්‍රියාකිරිම ඉතා අත්‍යවශ්‍ය බැව් සිහිපත් කරන ලදී.

14:06 **ගරු නාගරික මන්ත්‍රී චමික ජයමිණ වැවේගෙදර මැතිතුමා :**

ගරු මන්ත්‍රීතුමා කථාකරමින්, මේවනවිට සබරගමුව පළාත් සභාව විසුරුවාහැර ඇති බවත්, එම හේතුව නිසා විපක්ෂ ගරු මන්ත්‍රීවරුන්ට සංවර්ධන කටයුතු සඳහා වෙන්කල මුදල් නිසි පරිදි ලබාගැනීමට නොහැකි වී ඇති බැව් පැවසීය. මෙම හේතුව නිසා අදාල ජනතාවට එම ප්‍රතිලාභයන් භුක්ති විදීමට නොහැකි වී ඇති අතර විපක්ෂ ගරු මන්ත්‍රීවරුන්ට ජනතාවට මුහුණදීමට නොහැකිව දැඩි අපහසුතාවකට ලක්ව ඇති බැව් පැවසීය. පළාත් සභා විසුරුවා හැරීම නිසා මෙම තත්ත්වය උදා වී ඇති බැව් ජනතාව අවබෝධ කරගත යුතු බවත්, පැවසීය.

14:07 **ගරු නාගරික මන්ත්‍රී, ධර්මසේන සමරසිංහ මැතිතුමා :**

ගරු මන්ත්‍රීතුමා සභාව අමතමින් මේවන විට සබරගමුව පළාත් සභාව ඇතුලුව තවත් පළාත් සභා දෙකක් විසුරුවා ඇති අතර, ඉදිරියේ දී පළාත් සභා මැතිවරණය පැවැත්වීමට නියමිත බව සඳහන් කරන ලදී. සබරගමුව පළාත් ප්‍රධාන අමාත්‍යතුමා සබරගමුවට විශාල සේවයක් කල බවත්,එම සේවය අගය කරන බවත් සඳහන් කරන ලදී. මෙම මැතිවරණයේ දී එක්සත් ජනතා නිදහස් සන්ධානයට අතිවිශිෂ්ඨ ජයක් හිමිවන බවත් පැවසීය. රත්නපුර දිස්ත්‍රික්කය සඳහා තරග කරන අපේක්ෂකයින්ගේ ජයග්‍රහණය තහවුරු කිරීම සඳහා පියවර ගත යුතු බැව් සඳහන් කල ගරු මන්ත්‍රීතුමා මෙවර ප්‍රධාන අමාත්‍ය ධූරය රත්නපුර දිස්ත්‍රික්කයට ලබාදෙන ලෙස අතිගරු ජනාධිපතුමන්ගෙන් ඉල්ලීමක් කරන බවත් සඳහන් කරන ලදී.

බැංකියවත්ත ජල ටැංකිය ඉහල මාර්ගය සකස් කිරීම රු.50000/- ක මුදලක් ලබාදෙන ලෙසද ඉල්ලීමක් කරන ලදී.

14. **අවසානය :-**

**ගරු සභාපති, ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ මැතිතුමා :**

අද දින සභාවේ වැඩ කටයුතු සාර්ථකව නිමකිරීමට දායක වු ගරු උපසභාපතිතුමා ඇතුළු ගරු නාගරික මන්ත්‍රීතුමන්ලාට සිය ස්තුතිය පළකරමින් සභාවේ වැඩ කටයුතු ප.ව.2.00 ට පමණ අවසන් කරන ලදී.

ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ,
සභාපති,
බළන්ගොඩ නගර සභාව.